007

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2018

## 9 - ශ්‍රේණිය

## පුරවැසි අධ්‍යාපනය

නම/විභාග අංකය :- ........................................................................ කාලය: පැය 02යි.

### I කොටස

- සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට අංක 10 තෙක් ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) ඇමරිකා එක්සත් ජනපදයෙහි පැවති වහල්භාවය ඉවත් කිරීමට කටයුතු කළ ජනාධිපතිවරයා කවුරුන් ද?

(1) ජෝර්ජ් වොෂින්ටන් (2) ජෝර්ජ් බුෂ්
(3) ඒබ්‍රහම් ලින්කන් (4) වුඩ්රෝ විල්සන්

(02) වර්තමානයේ මුදල්වලට අමතර ආරක්ෂාවක් ලබාදීම සඳහා බැංකු ක්ෂේත්‍රය හඳුන්වා දී ඇති යන්ත්‍රය කුමක් ද?

(1) ටෙලර් යන්ත්‍රය (2) සී. වී. ස්කෑනර් යන්ත්‍රය
(3) පරිගනකය (4) ගණක යන්ත්‍රය

(03) මකරා මුල් කර ගත් සංස්කෘතිකාංග රැසක් අනුගමනය කරන ආසියාතික රට වන්නේ,

(1) ඉන්දියාව (2) චීනය
(3) බංග්ලාදේශය (4) මාලදිවයින

(04) ගැටුම් ශුභවාදීව නිරාකරණය කර නොගැනීම නිසා ඇතිවන ප්‍රතිවිපාකයකි.

(1) සාමය ස්ථාපිත වීම (2) සම්පත් නාස්තිය අවම වීම
(3) දේශපාලන ස්ථාවරත්වය (4) සමාජ සම්බන්ධතා පළුදු වීම

(05) යම්කිසි ආයතනයක ගණකාධිකාරී තනතුරක් ලබා ගැනීම සඳහා ඔබ තෝරාගත යුතු උසස් පෙළ විෂයධාරාව කුමක් ද?

(1) වාණිජ විෂය ධාරාව (2) විද්‍යා විෂය ධාරාව
(3) ගණිත විෂය ධාරාව (4) කලා විෂය ධාරාව

(06) රැකියාවක සාර්ථකත්වයට පත්වීම සඳහා වර්ධනය කරගත යුතු වඩාත් වැදගත් කුසලතාව වන්නේ,

(1) නිවැරදි මූල්‍ය කළමණාකරණය (2) මනා කාල කළමණාකරණය
(3) පෞද්ගලික හැසිරීම (4) අධිෂ්ඨානය හා කැපවීම

(07) යහපත් වෘත්තිකයකු තුළ නොතිබිය යුතු පෞද්ගලික චර්යාවකි.

(1) ඔබදා හදා ගැනීම (2) සමාජශීලී බව
(3) ආත්මාර්ථකාමී බව (4) පුහුදු බව

(08) පළාත් පාලන මැතිවරණයක් තුළින් තෝරා ගනු ලබන මහජන නියෝජිතයකු හඳුන්වන නම වන්නේ,

(1) පාර්ලිමේන්තු මන්ත්‍රී (2) ප්‍රාදේශීය සභා මන්ත්‍රී
(3) පළාත් සභා මන්ත්‍රී (4) මහ ඇමති

(09) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලාංකිකයෙකුට ඡන්ද බලය හිමිවීමට බලපාන සුදුසුකමක් වන්නේ,

(1) ප්‍රජා අයිතිය අහෝසි කර තිබීම
(2) ඡන්ද හිමි නාම ලේඛනයේ නම ඇතුළත් කර නොතිබීම
(3) වයස අවුරුදු 18ට අඩු වීම
(4) ශ්‍රී ලාංකික පුරවැසියකු වීම

(10) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත ක්‍රියාත්මක වීම තුළින් අහෝසි කරන ලද පළාත් පාලන ආයතනයකි.

(1) ගම්සභා (2) ප්‍රාදේශීය සභා
(3) නගර සභා (4) මහ නගර සභා

- අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල සඳහන් ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියෙන් යොදන්න.

(11) පාසල සමාජ පුරක්ෂිතතාව ගොඩ නගා ගැනීම සඳහා අවශ්‍ය සංවිධිත ආයතනයකි. (      )

(12) තිරසර සංවර්ධනය යනු අනාගත පරපුරෙහි අවශ්‍යතා පිළිබඳව සැලකිලිමත් වෙමින් වර්තමාන තවපුතු සඳහා සම්පත් යොදා නොගැනීමයි. (      )

(13) ඒපී රේඛා සහතික නිකුත් කරනු ලබන්නේ මාර්ග සංවර්ධන අධිකාරියයි. (      )

(14) 1931 සිට 1978 දක්වා ශ්‍රී ලංකාවේ පවත්වන ලද මැතිවරණ ක්‍රියාත්මක වූයේ සරල බහුතර නියෝජන ක්‍රමයකි. (      )

(15) ජාතික තරුණ සේවා සභාව මගින් වෘත්තීය පුහුණු පාඨමාලා පිළිබඳ තොරතුරු ලබාගත හැකි ය. (      )

- අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුර වරහන් තුළින් තෝරා දී ඇති හිස්තැන මත ලියන්න.

(16) "අලුත් අලුත් දෑ නොතනන ජාතිය ලොව නොනඟී" යනුවෙන් ............................................ ප්‍රකාශ කර ඇත.

(මර්සලින් ජයකොඩි පියතුමා / මුනිදාස කුමාරතුංග මහතා / එස්. මහින්ද හිමි)

(17) මහනගර සභාවක ව්‍යුහය තුළ පරිපාලන නිලධාරියා ............................................ නමින් හඳුන්වයි.

(නාගරික කොමසාරිස් / ලේකම් / සභාපති)

(18) ශ්‍රී ලංකාවේ වර්තමාන අධිකරණ පද්ධතියෙහි ඉහළ ම අධිකරණ ආයතනය වන්නේ ..................................... යි.

(ශ්‍රේෂ්ඨාධිකරණය / අභියාචනාධිකරණය / මහාධිකරණය)

(19) ද්විපක්ෂ ක්‍රමය ....................................... තුළ ක්‍රියාත්මක වේ.

(කියුබාව / ශ්‍රී ලංකාව / එක්සත් රාජධානිය)

(20) ගැටුම් විසඳීමේ දී නිතර ම ..................................... විසඳුමක් කරා එළඹිය යුතු ය.

(ජය පරාජය / ජය , ජය / පරාජය , පරාජය)

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- ඉතිරි ප්‍රශ්නවලින් ප්‍රශ්න හතරක් තෝරාගන්න.
- ඔබ පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව ප්‍රශ්න පහකි.

(01) (i) සමාජ සුරක්ෂිතතාව කෙරෙහි බලපාන මෘදු කුසලතා දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) ඕනෑම රටක ආර්ථිකයක සිදුවන ප්‍රධාන ක්‍රියාවලින් තුනෙන් දෙකක් දක්වන්න. (ලකුණු 02)

(iii) ශ්‍රී ලංකාවේ වර්තමානයේ පවත්වනු ලබන මැතිවරණ තුනක් නම් කරන්න. (ලකුණු 03)

(iv) ශ්‍රී ලංකාවේ මුලින් ම ආරම්භ කරන ලද මහ නගර සභා තුන නම් කරන්න. (ලකුණු 03)

(v) ගැටුම් ඇතිවිය හැකි පාර්ශව තුනක් ලියන්න. (ලකුණු 03)

(vi) රැකියා දන්වීමක් සඳහා ප්‍රතිචාර දක්විය හැකි ප්‍රධාන ක්‍රම තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(02) (1) පළාත් පාලන ආයතනයක ප්‍රධානියා සතු බලතල තුනක් දක්වන්න. (ලකුණු 03)

(2) පළාත් පාලන ආයතනයක් මුල්‍ය සම්පත් උපයා ගන්නා ක්‍රම හතරක් ලියන්න. (ලකුණු 04)

(3) පළාත් පාලන ආයතන මඟින් ඉටුවන සේවාවන් හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(03) (1) සාමකාමී පෞරුෂයක් ගොඩ නැඟීම සඳහා පවුලෙන් ඉටුවන කාර්යයන් තුනක් ලියන්න. (ලකුණු 03)

(2) සමාජ සුරක්ෂිතතාව සඳහා ආගමික ආයතනවලින් ඉටුවිය යුතු කාර්යයන් හතරක් දක්වන්න. (ලකුණු 04)

(3) සමාජ විරෝධී ක්‍රියා මැඩ පැවැත්වීම සඳහා ක්‍රියාත්මක වන ආයතන හතරක් නම් කරන්න. (ලකුණු 04)

(04) (1) කෘෂිකර්මාන්තයේ දී නවීන තාක්ෂණය යොදා ගන්නා අවස්ථා තුනක් දක්වන්න. (ලකුණු 03)

(2) නව තාක්ෂණික සොයාගැනීම් නිසා කාර්මික ක්ෂේත්‍රයේ දැකිය හැකි ප්‍රධාන වෙනස්කම් හතරක් ලියන්න.

(ලකුණු 04)

(3) කාලීන වෙනස්වීම් සමඟ රැකියා වෙළෙඳපොළෙහි විවිධ රැකියා සඳහා පවතින ඉල්ලුම වෙනස්වීමට බලපා ඇති කරුණු හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(05)(1) වර්තමානයේ සෘජු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක නොවීම සඳහා බලපාන හේතු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(2) ප්‍රජාතන්ත්‍රවාදයේ සාර්ථකත්වය තීරණය වීම කෙරෙහි බලපාන සාධක හතරක් දක්වන්න. (ලකුණු 04)

(3) පාසල් ශිෂ්‍යයෙකු වශයෙන් ඔබගෙන් සමාජයට ඉටුවිය යුතු යුතුකම් හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(06)(1) ලෝකයේ දක්නට ලැබෙන ගැටුම් ස්වභාවය අනුව ආකාර කිහිපයකි. ඉන් තුනක් සඳහන් කරන්න.(ලකුණු 03)

(2) ගැටුම් ඇතිවීමට බලපාන හේතු හතරක් දක්වන්න. (ලකුණු 04)

(3) ගැටුම් නිරාකරණය කර ගැනීම සඳහා යොදා ගන්නා ක්‍රමවේද හතරක් ලියන්න. (ලකුණු 04)

(07)(1) සම්මුඛ පරීක්ෂණයකට මුහුණදීමට සිදුවන ආකාර තුනක් ලියන්න. (ලකුණු 03)

(2) ඉල්ලුම් පත්‍රයක් සම්පූර්ණ කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හතරක් දක්වන්න. (ලකුණු 04)

(3) පහත සඳහන් රැකියා ස්ථානවල කරනු ලබන රැකියා එක බැගින් සඳහන් කරන්න.

(a) ගෘහස්ථ රැකියා -

(b) එළිමහනේ කරන රැකියා -

(c) ජංගම රැකියා -

(d) ස්ථිර ස්ථානවල කරන රැකියා - (ලකුණු 04)